**ශීර්ෂය 07 - අධිකරණ සේවා කොමිෂන් සභාව**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්වාගණනයකළමතය

අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවේමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 18දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 10දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018දෙසැම්බර් 31 දිනට අධිකරණ සේවා කොමිෂන් සභාවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්වාගණනයකළමතයසඳහාපදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍යප්‍රකාශනවිගණනයපිළිබඳවිගණකගේවගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපතිසම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මකඅවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකරණ සේවා කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශකළ නොහැකි විය.

(ආ)අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් ලෙස වාර්තා කළ යුතු රු.2,851,622 ක මුදලක් බදු නොවන ආදායම් ලෙස වාර්තා කර තිබුණු අතර ආදායම් ගණන්දීමේ නිළධාරියෙකු සිටින ආයතනයක් විසින් පිළියෙල කළ යුතු ඒසීඒ 01 ආකෘතියේද එම වටිනාකම දක්වා තිබුණි. | අධිකරණ සේවා කොමිෂන් සභාව සඳහාආදයම් සංකේතයක් නොමැති බැවින් ඒසීඒ 01 ආකෘතිය අදාළ කර නොගත යුතුවේ. | ඒසීඒ-01 ආකෘතිය තුළ ඇතුළත් කර ඇති අනෙකුත් ආදායම් ලැබීම් රු.2,851,622 ක වටිනාකමක් මින් පසු එම ආකෘතියෙහි ඇතුළත් නොකිරීමට කටයුතු කරමි. |
| (ආ)චක්‍රලේඛයේ 7(vi) ඡේදයේ විධිවිධාන ප්‍රකාරව අක් මුදල් ගැලපුම් ගිණුම් නිවැරදිව සකස්කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ අග්‍රිම ගිණුමේ බැර සටහනක් ලෙස පමණක් දක්වා තිබූ රු.4,199,025 ක හරස් සටහන අක් මුදල් ගැලපුම් ගිණුමට ඇතුළත් කර නොතිබුණි. | අක් මුදල් ගැලපුම් ගිණුම පිළියෙළ කිරීමේදී, චක්‍රලේඛයේ 7(vi)ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි අංක 7(vi) ඡේදය අනුව අක්මුදල් ගිණුම සකස් කිරීමේදී හරස් සටහන්වල අගය ඇතුළත් කළ යුතු බව දක්වා නොමැත. එබැවින් එය එම ගිණුම තුළ ඇතුළත් නොකර කාර්ය සාධන ප්‍රකාශයෙන් ලැබෙන අග්‍රිම ගිණුම් ශේෂය සමඟ ගලපා ඇත. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ වර්ෂය තුළ මුළු ලැබීම් රු.4,791,924 ක් වූ නමුත් එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ ඇතුළත් කර නොතිබුණි. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ වර්ෂය තුළ මුළු ලැබීම් රු.4,791,924 ක වටිනාකම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ සටහන් කළ යුතුවීම. | අත්තිකාරම් ගිණුමේ මුදල් ලැබීම් අග්‍රිම ගිණුමේ මුළු ශේෂයට ගැලපෙන පරිදි ඇතුළත් කර ඇත. අත්තිකාරම් ගිණුමෙහි ලැබීම් හරස් සටහන්වලින් සිදු වන ලැබීම් බැවින් සහ එම ලැබීම් අග්‍රිම ගිණුමට ඇතුළත් නොවන බැවින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි ඒවා ඇතුළත් කර නොමැත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම | | |
| මෙහෙයුම් කල්බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන සඳහා වාරික ගෙවීම වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු.මිලියන 2.35 ක් ප්‍රතිපාදනය කර තිබුණ ද එයින් රු. මිලියන 2.11 ක මුදලක් මුදල් රෙගුලාසි 66/69 යටතේ වෙනත් වැය විෂයන් 04 ක් වෙත මාරු කර තිබූ අතර, ඉතිරි ප්‍රතිපාදනය වූ රු.233,000 ක මුදලද උපයෝජනය කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව සකසුරුවම්කම හා කාර්යක්ෂමතාව ගැන නිසි සැලකිල්ලෙන් නිවැරදිව වියදම් ඇස්තමේන්තුව පිළියෙළ කළ යුතුවේ. | අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින් පැවැත්වූ විභාග, විභාග දෙපාර්තමේන්තුවට පැවරීමට කොමිෂන් සභාව තීරණය කළ බැවින් වෑන් රථයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය අත්හැරීම හා අධිකරණ අමාත්‍යාංශයට අයත් මෝටර් රථ දෙකක් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංචිතයට ලබා ගැනීම නිසා කල්බදු ක්‍රමයට වාහන ගැනීමේ අවශ්‍යතාවයක් ඇති නොවීය. එනිසා එම ප්‍රතිපාදන වෙනත් වැය විෂයන්ට මාරු කළ අතර රු.233,000 ක ප්‍රතිපාදන උපයෝජනය නොවී ඉතිරි විය. |
| (ආ) ප්‍රතිපාදන ඌන උපයෝජනය | | . |
| පුනරාවර්තන වැය විෂයන් 06 කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන5.7 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට එම වැය විෂයන්ට අදාල මුළු වියදම රු.මිලියන 3.44 ක් විය. ඒ අනුව රු. මිලියන 2.25 ක් වූ ශුද්ධ ඉතිරිවීම්, ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 28 සිට සියයට 86 දක්වා පරාසයක් තුළ විය. | මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව සකසුරුවම්කම හා කාර්යක්ෂමතාව ගැන නිසි සැලකිල්ලෙන් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙළ කළ යුතුය. | පවත්නා තත්ත්වයන් යටතේ සහේතුකව පූර්වාණුමාන කළ හැකි සියළු වියදම් ඇස්තමේන්තුවලට ඇතුළත් කරමින් නිසි සැලකිල්ලෙන් යුතුව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළද නොවැලැක්විය හැකි හේතු මත සහ බාහිර හේතු මත සත්‍ය වියදම ඇස්තමේන්තු හා නොසැසඳී ඇත. මේ සඳහා හේතු ලෙස දේශීය ගමන් වියදම් |

| | | |
|---|---|---|
| | | සීමා කිරීම, නිල ඇඳුම් හිමි නිලධාරීන් අඩු වීම, අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු පමණක් සිදු කිරීම, අපේක්ෂා කළ පරිදි විභාග පැවැත්වීමට නොහැකි වීම හා ණය ලබා ගත් නිලධාරීන් ස්ථාන මාරු වීම හා ණය පියවීම වැනි දෑ දැක්විය හැකිය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව, 2018 වර්ෂය සඳහා කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යභාරයන් හා අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම තුළ යාවත්කාලීන කළ සංවිධාන ව්‍යුහය, අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය, සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම හා අක්මුදල් අවශ්‍යතා සැලැස්ම ආදිය ඇතුළත්ව නොතිබුණු නිසා එම ක්‍රියාකාරී සැලැස්ම උක්ත චක්‍ර ලේඛය ප්‍රකාරව සකස් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | 2018 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, ජාතික අයවැය චක්‍ර ලේඛ අංක 06/2015 අනුව සහ අයවැය දෙපාර්තමේන්තුවේ 2016 පෙබරවාරි 01 දිනැති ලිපිය සමඟ ඒවා ඇති ආකෘතිය ප්‍රකාරව සකස් කර ඇත. 2019 වසරේ සිට රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 01/2014 ප්‍රකාරව අදාළ කරුණු ඇතුළත් කරක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුල අභ්‍යන්තර විගණන තනතුරක් අනුමතව පැවතිය ද 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයකු පත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1)වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණනය සිදු කිරීම සඳහාඅභ්‍යන්තර විගණකවරයෙකු පත්කළ යුතුවේ. | කළමණාකරණසේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1021/Vol I හා 2017 ජූලි 18 දිනැති ලිපිය මඟින් අධිකරණ සේවා කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටු වීමට කාර්යමණ්ඩලය අනුමත කර ඇත. නමුත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල ඉතා අබලන් තත්වයේ පවතින බැවින් ඉන් ඉවත් වී 2017 නොවැම්බර් 15 දින සිට බහාලුම් පෙට්ටිවලින් සකසන ලද සීමිත ඉඩකඩ සහිත තාවකාලික කාර්යාලයක අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ කටයුතු පවත්වාගෙන යනු ලැබේ. ඉහත අනුමත කර ඇති කාර්යමණ්ඩලය බඳවා ගැනීම මත වැඩි වන කාර්යමණ්ඩලය සඳහා ඉඩපහසුකම් කිසිසේත්ම නොමැති බැවින් මෙතෙක් එම බඳවා ගැනීම් සිදු කර නැත. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කොමිෂන් සභාව විසින් විගණන හා කළමණාකරන කමිටුවක් | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) හා (2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමණාකරන කමිටුවක් පත්කර නියමිත කාළ වකවානු තුළ විගණන හා | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම හේතුවෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක, අභ්‍යන්තර විගණක හා අධිකරණ ලිපිකරු යන තනතුරු සියයට 100 |

| | | |
|---|---|---|
| පත්කර නොතිබුණි. | කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුවේ. | ක් පුරප්පාඩු වී පවති. ඒ අනුව අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමේ දී සහ විගණන හා කළමණාකරණ කමිටු පවත්වාගෙන යාමේ දී බාධාකාරී තත්වයක් පවතී. |

**5.<u>මානව සම්පත් කළමනාකරණය</u>**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට කොමිෂන් සභාවේ විවිධ තනතුරු සඳහා පුරප්පාඩු සංඛ්‍යාව 69 ක් විය. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. අතිරික්ත තනතුරු වේ නම් කාර්යමණ්ඩල වල සංඛ්‍යාව සංශෝධනයන් කරගත යුතුවේ. | එම පුරප්පාඩු 69 න් 12 ක් අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරුවලට අයත් වන අතිරික්ත නිලධාරින්ගෙන් හා තනතුරුවල 16 ක් අධිකරණ රෙජිස්ට්‍රාර් සහ අධිකරණ කළමණාකරණ සහකාර සේවයේ නිලධාරින්ගෙන් පූර්ණය කරගනිමින් රාජකාරී ඉටුකර ගැනීමට කටයුතුකර ඇත. එසේම එම පුරප්පාඩු මධ්‍යයේ වුවද 2018 වර්ෂයට අදාළව ප්‍රශස්ත මට්ටමේ කාර්යසාධනයක් අත්පත්කර ගැනිමට අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය සමත් වී ඇත. |